# 9 බැංකු ගිණුම සහ බැංකු සැසඳුම් විස්තරය




මෙම පරිච්ඡේදය මගින් පහත දැක්වෙන කරුණු පිළිබඳ ව සාකච්ඡා කෙරේ.

9.1 බැංකු ගිණුම

- බැංකු ගිණුමක මුදල් තැන්පතු සටහන් කිරීම
- බැංකු ගිණුමක චෙක්පත් තැන්පතු සටහන් කිරීම
- ගෙවීම් සඳහා චෙක්පත් නිකුත් කිරීම
- චෙක්පත් අගරු වීම
- බැංකු අයිරාව

9.2 බැංකු සැසඳුම් විස්තරය

- බැංකු ප්‍රකාශය
- බැංකු ගිණුමේ සහ බැංකු ප්‍රකාශයේ ශේෂ වෙනස් වීමට හේතු
- බැංකු ගිණුමේ ශේෂය සංශෝධනය කිරීම
- බැංකු සැසඳුම් ප්‍රකාශය පිළියෙල කිරීම

## 9.1 බැංකු ගිණුම

මුදල් ගනුදෙනු පහසුවෙන් හා ආරක්ෂිත ව සිදුකර ගැනීම සඳහා බැංකු ජංගම ගිණුමක් විවෘතකර එමගින් ගනුදෙනු කිරීමට බොහෝ ව්‍යාපාරිකයෝ වැඩි කැමැත්තක් දක්වති. මුදල් පොත මෙන් ම බැංකු ජංගම ගිණුම ද ව්‍යාපාරයේ වත්කම් ගිණුම් වර්ගයට අයත් වන බැවින් බැංකු ගිණුම මාර්ගයෙන් සිදුවන ගනුදෙනු වාර්තා කිරීමේ දී වත්කම්වලට අදාළ ද්විත්ව සටහන් රීතිය සැලකිල්ලට ගත යුතු ය.

බැංකු ජංගම ගිණුම තුළින් සිදුකෙරෙන ගනුදෙනු ව්‍යාපාරයේ පොත්වල සටහන් කරන ආකාරය අවබෝධ කර ගනිමු.

### 01. බැංකුවේ මුදල් තැන්පත් කිරීම

ජංගම ගිණුමක් ආරම්භ කිරීමේ දී යම් නියමිත මුදල් ප්‍රමාණයක් බැංකුවේ තැන්පත් කළ යුතුවේ. ඊට අමතර ව ව්‍යාපාරයට ලැබෙන මුදල් බැංකු ගිණුමේ තැන්පත් කිරීම සිදු කෙරේ. බැංකුවේ මුදල් තැන්පත් කළ විට බැංකු ජංගම ගිණුමේ ශේෂය වැඩිවන අතර ව්‍යාපාරයේ මුදල් ශේෂයෙහි අඩුවීමක් සිදු වේ.

ඒ අනුව මුදල් තැන්පත් කිරීම් ගිණුම් ගත කරන්නේ පහත සඳහන් පරිදි ය.

| | |
|---|---|
| බැංකු ගිණුම | හර |
| මුදල් පොත | බැර |

එවිට ද්විත්ව සටහන සම්පූර්ණ වේ.

බැංකුවේ මුදල් තැන්පත් කිරීමේදී තැන්පතු පත්‍රිකාව සම්පූර්ණ කර, ඒ සමග අදළ මුදල බැංකුව වෙතට ලබාදිය යුතු ය. බැංකුව සිදු කරන්නේ පිටපත් දෙකකින් යුක්ත තැන්පතු පත්‍රිකාවේ අනුපිටපත ව්‍යාපාරයට (ගිණුම් හිමියාට) ඒ අවස්ථාවේ දී ම ලබාදීම ය. ව්‍යාපාරය විසින් බැංකුවේ තැන්පත් කළ මුදල් සටහන් කිරීමේ දී එම අනුපිටපත මූලාශ්‍ර ලේඛනය ලෙස භාවිතයට ගැනේ.

### 02. ව්‍යාපාරයට ලැබෙන චෙක්පත් බැංකුවේ තැන්පත් කිරීම

චෙක්පත් තැන්පත් කිරීම නිසා ව්‍යාපාරයේ බැංකු ගිණුමේ මුදල් වැඩිවේ. ණයගැතියන් ගෙන්, අත්පිට විකුණුම්වලින් යනාදි වශයෙන් චෙක්පත් ලැබෙන අතර ඒවා ලැබුණු අවස්ථාවේ දී මුලින් ම මුදල් පොතට හර කරන බව මීට පෙර පැහැදිලි කර ඇත.

එසේ මුදල් පොතේ හරට සටහන් කළ චෙක්පත් පසු ව බැංකුවේ තැන්පත් කරන විට පහත දැක්වෙන පරිදි ද්විත්ව සටහන තැබිය යුතු වේ.

| | |
|---|---|
| බැංකු ගිණුම | හර |
| මුදල් පොත | බැර |



නොමිලේ බෙදා හැරීම සඳහා ය.

කෙසේ වෙතත් චෙක්පත් ලැබෙන අවස්ථාවේ දී ම ඒවා බැංකුවේ තැන්පත් කරන්නේ නම් මුදල් පොතට හර කරනවා වෙනුවට ඍජුව ම ව්‍යාපාරයේ බැංකු ගිණුමට හර කළ හැකි වේ.

**නිදසුන ඃ-**


විකුණුම්වලින් ලැබුණු රු. 10 000ක චෙක්පත එම අවස්ථාවේ දී ම බැංකුවේ තැන්පත් කරනු ලැබී ය.

එවිට ද්විත්ව සටහන වනුයේ

බැංකු ගිණුම හර 10 000
විකුණුම් ගිණුම බැර 10 000

ලැබෙන චෙක්පත් බැංකුවේ තැන්පත් කිරීමේ දී තැන්පතු පත්‍රිකාව සම්පූර්ණ කර ඒ සමග චෙක්පත් බැංකුවට ලබාදීම අවශ්‍ය වේ. එම තැන්පතු පත්‍රිකාවේ අනුපිටපත බැංකුව විසින් නැවත ව්‍යාපාරයට (ගිණුම් හිමියාට) ලබා දේ. ව්‍යාපාරයේ බැංකු ගිණුමේ චෙක්පත් තැන්පත් කිරීමට අදළ සටහන තැබීමේ දී තැන්පතු පත්‍රිකාවේ අනුපිටපත මූලාශ්‍ර ලේඛනය ලෙස භාවිතයට ගනී.

**චෙක්පත් තැන්පත් කිරීමේ පත්‍රිකාවක පිටපතක් පහත දැක්වේ. එය නිරීක්ෂණය කරන්න.**


මහජන බැංකුව
மக்கள் வங்கி PEOPLE'S BANK OFFICE COPY
චෙක් තැන්පතු තුණ්ඩුව
காசோலை வைப்புச்சீட்டு CHEQUE PAYING - IN SLIP
ආප. ப.இ. FORM 214 DP

BRANCH CODE AND ACCOUNT NO.

DATE

PAID INTO CREDIT OF

AMOUNT IN WORDS RS.

NO OF CHEQUES

| BANK / BRANCH CODE NO. | | CHEQUE No. | RS. | CTS. |
|---|---|---|---|---|
| | | | | |
| | | | | |
| | | | | |
| | | | | |
| | | | | |
| | | | | |
| | | TOTAL | | |

DEPOSITOR | CASHIER | OFFICER

DO NOT WRITE ANYTHING BELOW THIS LINE

PRINTLAND 06-09-07


රූපය 9.1 චෙක්පත් තැන්පත් කිරීමේ පත්‍රිකාවක පිටපතක්

## 03. චෙක්පත් නිකුත් කිරීම

ණයහිමියන්ට ගෙවීම්, ගැනුම්, වියදම් ආදිය සඳහා චෙක්පත් නිකුත් කිරීම මගින් ගෙවීම් කළ හැකි ය. චෙක්පත් නිකුත් කිරීමේ දී ඒවා සම්පූර්ණ කර ඊට අදාළ මූලික තොරතුරු චෙක්පොතෙහි ඉතිරි වන කුඩා කොටස වන පිළිපතේ ද සටහන් කර නිකුත් කිරීම සාමාන්‍යයෙන් සිදුවන්නකි.

**පහත දැක්වෙන චෙක්පත් ආකෘතියේ (i) කොටසේ පිළිපත ද (ii) කොටසේ චෙක්පත ද පවතී. එය නිරීක්ෂණය කරන්න.**

I කොටස II කොටස




රූපය 9.2 චෙක්පතක පිටපතක්

චෙක්පත් මගින් ගෙවීම් සිදු කිරීමේ දී එම ගෙවීමට අදාළ තොරතුරු ගෙවීම් වවුචරයක සටහන් කරනු ලැබේ. ඒ අනුව චෙක්පත්වලින් සිදුකරන ගෙවීම් බැංකු ගිණුමේ සටහන් කිරීමේ දී ගෙවුම් වවුචරය මූලාශ්‍ර ලේඛනය ලෙස යොදගැනේ.

චෙක්පත් මගින් ගෙවීම් සිදු කළ විට බැංකුවේ ඇති මුදල් ප්‍රමාණය අඩුවේ. අදළ ද්විත්ව සටහන පහත පරිදි වේ.

| | |
|---|---|
| වියදම් ගිණුම හෝ ගෙවීමට අදළ ගිණුම | හර |
| බැංකු ගිණුම | බැර |


## 04. චෙක්පත් අගරු වීම

චෙක්පත් අවිධිමත් ව ලියා තිබීම, ජංගම ගිණුමේ මුදල් නොතිබීම, චෙක්පතට තබා ඇති අත්සන ආදර්ශ අත්සනට වඩා වෙනස්වීම, යනාදී හේතු මත බැංකුව විසින් චෙක්පත් ප්‍රතික්ෂේප කරන අවස්ථා ඇති අතර එය චෙක්පත් අගරු වීම ලෙස හඳුන්වයි.

මේ අනුව තැන්පත් කළ චෙක්පත් මෙන් ම නිකුත් කළ චෙක්පත් ද අගරු විය හැකි ය. චෙක්පත් අගරු වීමට අදළ නිවේදනයක් බැංකු විසින් ව්‍යාපාරයට (ජංගම ගිණුම් හිමියාට) එවනු ලබයි.


නොමිලේ බෙදා හැරීම සඳහා ය.

අගරු චෙක්පත් නිවේදනයක පිටපතක් පහත දැක්වේ. එය නිරීක්ෂණය කරන්න.



අගරු චෙක්පත් නිවේදනය
மறுக்கப்பட்ட காசோலை அறிவிப்பு
**Cheque Return Notification**

නැවත ඉදිරිපත් කළහැකි විට, අගරු වූ චෙක්පත වෙනුවට භාවිතා කළ හැක
மீள சமர்ப்பிக்கக்கூடியதாயின், மறுக்கப்பட்ட காசோலைக்கு பதிலாக பாவிப்பதற்கு அனுமதிக்கப்பட்டது
Permitted to use as a replacement for the returned cheque, if representable

PART-A
Customer's Copy
9999 00032732
LCPL - [illegible]
Date: 25-May-2006

Retained by Customer

**Collecting Bank: Peoples Bank**

Bank's Use

අගරු චෙක් පතේ විස්තර / திருப்பி அனுப்பும் காசோலையின் விபரம் / **Cheque Return Information**

| | |
|---|---|
| චෙක්පත් අංකය / காசோலை இலக்கம் / Cheque Number | : 654298 |
| ගෙවන බැංකුව / செலுத்தும் வங்கி / Paying Bank | : Peoples Bank |
| වටිනාකම (රු) / தொகை (ரூபா) / Amount (Rs.) | : 3,500.00 |
| ගිණුම් අංකය / கணக்கு இலக்கம் / Account Number | : |
| UI නොම්මරය / UI இலக்கம் / UI Number | : 20060523713530704107400015 |
| අගරු වීමට හේතුව (කේතය) / திருப்பி அனுப்பப்படுவதற்கான காரணம் (குறியீடு) / Return Reason (Code) | : Payment Postponed Pending Drawer's Confirmation(14) |

Authorized Bank's Signature

CANCELLED
15 MAY
LANKA CLEAR (PVT) LTD.
MATARA. RSC

---

**Cheque Clearing Information**

PART-B
Bank's Copy
9999 00032732
LCPL - [illegible]
Date: 25-May-2006

CITS

Retained by Collecting Bank when represented

**Collecting Bank: Peoples Bank**

**Cheque Information**

| | | | |
|---|---|---|---|
| **UI Number** | : 20060523713530704107400015 | **First Presentment Date :** | 23-May-2006 |
| **Amount (Rs.)** | : 3,500.00 | **Paying Bank** | : Peoples Bank |
| **Cheque Number** | : 654298 | **Paying Branch** | : Urubokka |

INSTRUCTIONS FOR RE-PRESENTMENT

**First Return - This CRN can be re-presented only to the original presenting bank subject to conditions.**

| | | |
|---|---|---|
| **Clearing Information** | **First Return** | **Second Return** |
| Return Reason/Code | Payment Postponed Pending Drawer's Confirmation(14) | |

| | |
|---|---|
| Collecting Branch | Gandara |
| Collecting LCPL Center | [illegible] |
| Date of Return | 25-May-2006 |

CANCELLED
15 MAY
LANKA CLEAR (PVT) LTD.
MATARA. RSC

**Conditions**
1. CRN with any mutilation or tear will not be accepted.
2. CRN is not negotiable and cannot be encashed.
3. To be presented within 6 months of 1st presentment date or cheque date, whichever is earlier.

---

PART-C
Bank's Copy
9999 00032732
LCPL - [illegible]
Date: 25-May-2006

**THIS IS A TRUE COPY OF THE ORIGINAL CHEQUE**

CITS

Cheque Status: **Re-presentable**

**Collecting Bank: Peoples Bank**

Forwarded for Cheque Clearing by Collecting Bank

Front Image of Returned Cheque

මහජන බැංකුව
1570019724
3500/.
⑈654298⑈ 7135⑆271⑆ ⑇0000350000⑇

CANCELLED
15 MAY
LANKA CLEAR (PVT) LTD.
MATARA. RSC

For Endorsements

**20060523 7135307 04 10740015** **3,500.00**

රූපය 9.3 අගරු චෙක්පත් නිවේදනයක පිටපතක්



නොමිලේ බෙදා හැරීම සඳහා ය.

**තැන්පත් කළ චෙක්පත් අගරු වීම**

අත්පිට විකුණුම්වලින්, ණය ගැතියන්ගෙන් ආදී ලෙස ලැබී ඇති චෙක්පත් බැංකුවේ තැන්පත් කර ව්‍යාපාරය විසින් එම අගය බැංකු ගිණුමට හර කරනු ලැබේ. එසේ සිදු කරන්නේ බැංකු ගිණුමේ ශේෂය වැඩිවන බැවිනි. එහෙත් බැංකුව විසින් මෙම චෙක්පත අගරු කළ විට සත්‍ය වශයෙන් බැංකු ශේෂය වැඩි වී නැත. එම නිසා තැන්පත් කළ අවස්ථාවේ තැබූ හර සටහන ඉවත් කළ යුතු ය. මෙහි දී බැංකු ගිණුමෙන් අගරු වූ චෙක්පතේ වටිනාකම ඉවත්කර, චෙක්පත ලබාදුන් පාර්ශ්වයෙන් නැවත අයකර ගත යුතු මුදලක් ලෙස දක්විය යුතු ය. ඒ අනුව අගරු වූ චෙක්පතේ වටිනාකම පහත සඳහන් පරිදි සටහන් කළ යුතු ය.

| | |
|---|---|
| ණයගැති ගිණුම | හර |
| බැංකු ගිණුම | බැර |

**නිදසුන :-**

ණයගැතියන්ගෙන් ලැබී බැංකුවේ තැන්පත් කළ රු. 8 000ක චෙක්පත අගරු වූ බව බැංකුව දනුම් දෙන ලදි.

මෙහිදී අගරු වූ චෙක්පතෙහි අගය සටහන් කිරීමට අදාළ ද්විත්ව සටහන වන්නේ,

| | | |
|---|---|---|
| ණයගැති ගිණුම | හර | රු. 8 000 |
| බැංකු ගිණුම | බැර | රු. 8 000 |

**නිකුත්කළ චෙක්පත් අගරු වීම**

චෙක්පත් නිකුත් කිරීමේ දී අදාළ වියදම් ගිණුම හෝ අදාළ වෙනත් ගිණුම් හර කර බැංකු ගිණුම බැර කළ යුතු බව මීට පෙර දක්වන ලදී. එසේ නිකුත් කළ චෙක්පත් අගරු වීමේ දී චෙක්පත නිකුත් කළ අවස්ථාවේ තබා ඇති සටහන ඉවත් කළ යුතු වේ. එය සිදු කරන්නේ චෙක්පත නිකුත් කිරීමේ දී තැබූ සටහනට ප්‍රතිවිරුද්ධ සටහනක් තැබීමෙන් ය. ඒ අනුව නිකුත් කළ චෙක්පත් අගරු වනවිට පහත සඳහන් පරිදි සටහන් කළ යුතු ය.

| | |
|---|---|
| බැංකු ගිණුම | හර |
| අදාළ අනෙක් ගිණුම | බැර |

**නිදසුන :-**

ණයහිමියන් සඳහා ව්‍යාපාරය නිකුත් කළ රු. 15 000ක චෙක්පතක් අගරු වූ බව බැංකුව දනුම් දීම

චෙක්පත අගරු වීම සටහන් කිරීමට අදාළ ද්විත්ව සටහන වන්නේ

| | | |
|---|---|---|
| බැංකු ගිණුම | හර | රු. 15 000 |
| ණයහිමි ගිණුම | බැර | රු. 15 000 |



නොමිලේ බෙදා හැරීම සඳහා ය.

**නිදසුන ඃ-**

20XX.06.01 දිනට නෙත්මිගේ ව්‍යාපාරයේ පැවැති ශේෂ කිහිපයක් පහත දැක්වේ.

| | රු. |
|---|---|
| මුදල් | 185 000 |
| ණයගැති | 55 000 |
| ණයහිමි | 85 000 |

ජූනි මාසය තුළ පහත සඳහන් ගනුදෙනු සිදු විය.

| | |
|---|---|
| 20XX.06.02 | රු. 22 000ක් තැන්පත් කර බැංකු ජංගම ගිණුමක් විවෘත කිරීම |
| 06.03 | ණයගැතියකුගෙන් අංක 455 දරන රු. 9 000ක චෙක්පත ලැබුණා |
| 06.04 | ණයගැතියකුගෙන් ලැබී තිබුණු අංක 455 දරන රු. 9 000ක චෙක්පත බැංකුවේ තැන්පත් කිරීම |
| 06.08 | විකුණුම් සඳහා ලැබුණු අංක 562 දරන රු. 12 000ක චෙක්පත එම අවස්ථාවේ දී ම බැංකුවේ තැන්පත් කිරීම |
| 06.12 | මුදල් රු. 15 000ක් බැංකු ජංගම ගිණුමේ තැන්පත් කිරීම |
| 06.15 | චෙක් අංක 301 යටතේ ණය හිමියන්ට රු. 7 600ක් ගෙවීම, මෙහිදී ලැබුණු වට්ටම් රු 400කි. |
| 06.18 | විදුලි වියදම් සඳහා අංක 302 දරන රු. 5 000ක චෙක්පතක් නිකුත් කිරීම |
| 06.20 | විදුලි වියදම් සඳහා නිකුත් කළ රු. 5 000ක චෙක්පත අගරු වීම |
| 06.24 | අංක 415 දරන රු. 13 000ක චෙක්පත ණය ගැතියන්ගෙන් ලැබීම |
| 06.26 | ණයගැතියන්ගෙන් ලැබුණු අංක 415 දරන චෙක්පත බැංකුවේ තැන්පත් කිරීම |
| 06.28 | බැංකුවේ තැන්පත් කළ අංක 415 දරන චෙක්පත අගරු වීම |
| 06.29 | ණයගැතියන්ගෙන් අංක 632 දරන රු. 5 700ක චෙක්පතක් ලැබුණි. මෙහි දී ලබා දුන් වට්ටම රු 300කි. මෙම චෙක්පත එම අවස්ථාවේ දී ම බැංකුවේ තැන්පත් කරන ලදි. |

මෙම ගනුදෙනු බැංකු ගිණුමේ සටහන් කරන ආකාරය සහ අදළ අනෙකුත් ගිණුම්වලට පිටපත් කරන ආකාරය පහත දැක්වේ.

හර බැංකු ගිණුම බැර

| දිනය | විස්තරය | ස. පි. | වට්ටම් | වටිනාකම රු. | දිනය | විස්තරය | ස. පි. | වට්ටම් | වටිනාකම රු. |
|---|---|---|---|---|---|---|---|---|---|
| 20XX.06.02 | මුදල් | | | 22 000 | 20XX.06.15 | ණය හිමි (301) | | 400 | 7 600 |
| 06.04 | මුදල් (455) | | | 9 000 | 06.18 | විදුලි (302) | | | 5 000 |
| 06.08 | විකුණුම් (562) | | | 12 000 | 06.28 | ණය ගැති (415) | | | 13 000 |
| 06.12 | මුදල් | | | 15 000 | | | | | |
| 06.20 | විදුලි(302) | | | 5 000 | | | | | |
| 06.26 | මුදල් (415) | | | 13 000 | | | | | |
| 06.29 | ණය ගැති (632) | | 300 | 5 700 | | | | | |



නොමිලේ බෙදා හැරීම සඳහා ය.

හර | මුදල් පොත | බැර

| දිනය | විස්තරය | ස. පි | වටිනාකම රු. | දිනය | විස්තරය | ස. පි | වටිනාකම රු. |
|---|---|---|---|---|---|---|---|
| 20XX.06.01 | ඉ/ගෙ ශේෂය | | 185 000 | 20XX.06.02 | බැංකු | | 22 000 |
| 06.03 | ණයගැතියෝ | | 9 000 | 06.04 | බැංකු | | 9 000 |
| 06.24 | ණය ගැති (415) | | 13 000 | 06.12 | බැංකු | | 15 000 |
| | | | | 06.26 | බැංකු (415) | | 13 000 |

හර | ණයගැති ගිණුම | බැර

| දිනය | විස්තරය | ස. පි | වටිනාකම රු. | දිනය | විස්තරය | ස. පි | වටිනාකම රු. |
|---|---|---|---|---|---|---|---|
| 20XX.06.01 | ඉ/ගෙ ශේෂය | | 55 000 | 20XX.06.03 | මුදල් | | 9 000 |
| 06.28 | බැංකු (අගරු චෙක්) | | 13 000 | 06.24 | මුදල් චෙක් 415 | | 13 000 |
| | | | | 06.29 | බැංකු | | 5 700 |
| | | | | 06.29 | වට්ටම් | | 300 |

හර | ණයහිමි ගිණුම | බැර

| දිනය | විස්තරය | ස. පි | වටිනාකම රු. | දිනය | විස්තරය | ස. පි | වටිනාකම රු. |
|---|---|---|---|---|---|---|---|
| 20XX.06.15 | බැංකු | | 7 600 | 20XX.06.01 | ඉ/ගෙ ශේෂය | | 85 000 |
| 06.15 | වට්ටම් | | 400 | | | | |

හර | විකුණුම් ගිණුම | බැර

| දිනය | විස්තරය | ස. පි | වටිනාකම රු. | දිනය | විස්තරය | ස. පි | වටිනාකම රු. |
|---|---|---|---|---|---|---|---|
| | | | | 20XX.06.08 | බැංකු | | 12 000 |

හර | විදුලිය ගිණුම | බැර

| දිනය | විස්තරය | ස. පි | වටිනාකම රු. | දිනය | විස්තරය | ස. පි | වටිනාකම රු. |
|---|---|---|---|---|---|---|---|
| 20XX.06.18 | බැංකු | | 5 000 | 20XX.06.20 | බැංකු (අගරු චෙක්) | | 5 000 |

හර | දුන් වට්ටම් ගිණුම | බැර

| දිනය | විස්තරය | ස. පි | වටිනාකම රු. | දිනය | විස්තරය | ස. පි | වටිනාකම රු. |
|---|---|---|---|---|---|---|---|
| 20XX.06.30 | ණයගැති | | 300 | | | | |



නොමිලේ බෙදා හැරීම සඳහා ය.

හර ලද වට්ටම් ගිණුම බැර

| දිනය | විස්තරය | ස. පි | වටිනාකම රු. | දිනය | විස්තරය | ස. පි | වටිනාකම රු. |
|---|---|---|---|---|---|---|---|
| | | | | 20XX.06.30 | ණය හිමි | | 400 |



## ක්‍රියාකාරකම 01

සහන් අබේනායකගේ ව්‍යාපාරයේ 2XXX.06.01 දිනට පැවති ශේෂයන් මෙසේය.

| | රු. |
|---|---|
| මුදල් | 90 000 |
| ණය ගැති | 60 000 |
| ප්‍රාග්ධනය | 70 000 |
| ණයහිමි | 80 000 |

20XX ජුනි මාසයේ සිදු වූ බැංකු ගනුදෙනු පහත දැක්වේ.

20XX.06.05 රු. 25 000ක් තැන්පත් කොට බැංකු ජංගම ගිණුමක් විවෘත කිරීම

06.08 අංක 40 දරන රු. 20 000ක චෙක් පත නිකුත් කර භාණ්ඩ මිල දී ගැනීම

06.10 පහත සඳහන් චෙක්පත් බැංකුවේ තැන්පත් කිරීම
ණයගැතියන්ගෙන් ලැබී තිබුණු අංක 68 දරන රු. 12 000ක චෙක්පත
අත්පිට විකුණුම්වලින් ලැබී තිබුණු අංක 75 දරන රු. 18 000ක චෙක්පත
ණයගැතියන්ගෙන් ලැබී තිබුණු අංක 66 දරන රු. 18 000ක චෙක්පත

06.15 මුදලින් රු. 10 000ක් බැංකුවේ තැන්පත් කිරීම

06.16 ණයගැතියන්ගෙන් ලැබී බැංකුවේ තැන්පත් කර තිබූ රු. 12 000ක අංක 68 දරන චෙක්පත අගරු වීම

06.20 චෙක්පත් නිකුත් කිරීම්
බදු කුලී සඳහා අංක 41 දරන රු. 8 000ක චෙක්පත
ණයහිමියන්ට අංක 42 දරන රු. 15 000ක චෙක්පත

06.24 බදු කුලී සඳහා නිකුත් කළ රු. 8 000 චෙක්පත අගරු වීම

06.26 බදු කුලී සඳහා නිකුත් කළ අගරු වූ චෙක්පත වෙනුවට අංක 43 දරන රු. 8 000 චෙක්පත නිකුත් කිරීම

06.27 අත්පිට විකුණුම්වලින් ලැබුණු අංක 105 දරන රු. 21 000ක චෙක්පත එම අවස්ථාවේ දී ම බැංකුවේ තැන්පත් කිරීම

අවශ්‍ය වන්නේ

(1) 20XX.06.30 න් අවසන් වූ මාසය සඳහා බැංකු ගිණුම පිළියෙල කර තුලනය කරන්න.

(2) අනෙකුත් ලෙජර ගිණුම්වලට පිටපත් කර තුලනය කරන්න.



නොමිලේ බෙද හැරීම සඳහා ය.

## බැංකු අයිරාව

බැංකු ජංගම ගිණුමේ පවතින මුදල් ප්‍රමාණය ඉක්මවා චෙක්පත් නිකුත් කිරීමේ පහසුකම වාණිජ බැංකු විසින් ගිණුම් හිමියන්ට ලබා දෙන අවස්ථා ඇත. එවැනි පහසුකමක් බැංකු අයිරාව ලෙස හැඳින්වේ. ඒ අනුව ව්‍යාපාරය විසින් බැංකු ගිණුමේ පවතින මුදල් ප්‍රමාණය ඉක්මවා චෙක්පත් නිකුත් කළහොත් බැංකු ගිණුමේ හර පැත්තේ එකතුවට වඩා එහි බැර පැත්තේ එකතුව වැඩි වීමෙන් බැංකු ගිණුමේ බැර ශේෂයක් ලැබේ. එලෙස පවතින බැර ශේෂය බැංකු අයිරාව වන අතර එය ව්‍යාපාරයේ වගකීමක් වේ. ඒ අනුව ගිණුමේ පවතින ශේෂය ඉක්මවා චෙක්පත් නිකුත් කළ විට බැංකුව එම චෙක්පත්වලට ගෙවීම් කිරීම නිසා ගිණුම් හිමියා බැංකුවට ණයගැති වන අගය බැංකු අයිරාව ලෙස හැඳින්වේ.

**නිදසුන :-**

20XX.07.01 දිනට සමාධිගේ ව්‍යාපාරයේ බැංකු ගිණුමේ තිබූ වාසිදයක ශේෂය (හර ශේෂය) රු. 12 000 කි. ජුලි මාසය තුළ දී බැංකු ගිණුම සමග සිදුකළ ගනුදෙනු පහත දැක්වේ.

20XX.07.05 මුදල් තැන්පත් කිරීම් රු. 8 000 කි.

**ලැබී ඇති චෙක්පත් තැන්පත් කිරීම්.**

20XX.07.08 විකුණුම්වලින් ලැබී තිබුණු රු. 9 000ක චෙක්පත (චෙ.අ.20)
20XX.07.15 කුලී ආදායම් සඳහා ලැබී තිබුණු රු. 7 000ක චෙක්පත (චෙ.අ.114)
20XX.07.20 ණයගැතියකුගෙන් ලැබී තිබුණු රු. 6 000ක චෙක්පත (චෙ.අ.95)

**චෙක්පත් නිකුත් කිරීම්.**

20XX.07.12 ණයහිමියන්ට රු. 16 000 (චෙ.අ.33)
20XX.07.22 සේවක වැටුප් සඳහා රු. 15 000 (චෙ.අ.34)
20XX.07.25 ගැනුම් සඳහා රු. 25 000 (චෙ.අ.35)

ඉහත සඳහන් ගනුදෙනු බැංකු ගිණුමේ සටහන් කරන ආකාරය සහ බැංකු ගිණුම තුලනය කර ශේෂය ලබාගන්නා ආකාරය පහත දැක්වේ.

හර | බැංකු ගිණුම | බැර

| දිනය | විස්තරය | ස.පි | වටිනාකම රු | දිනය | විස්තරය | ස.පි | වටිනාකම රු |
|---|---|---|---|---|---|---|---|
| 20XX.07.01 | ශේෂය ඉ/ගෙ | | 12 000 | 20XX.07.12 | ණය හිමි (33) | | 16 000 |
| 07.05 | මුදල් | | 8 000 | 07.22 | වැටුප් (34) | | 15 000 |
| 07.08 | මුදල් (20) | | 9 000 | 07.25 | ගැනුම් (35) | | 25 000 |
| 07.15 | මුදල් (114) | | 7 000 | | | | |
| 07.20 | මුදල් (95) | | 6 000 | | | | |
| 07.31 | ශේෂය ප/ගෙ | | 14 000 | | | | |
| | | | 56 000 | | | | 56 000 |
| | | | | 08.01 | ශේෂය ඉ/ගෙ | | 14 000 |



නොමිලේ බෙදා හැරීම සඳහා ය.

ඉහත නිදසුනේ දක්වා ඇති පරිදි බැංකු ගිණුමේ බැර පැත්තේ එකතුව රු. 56 000කි. හර පැත්තේ එකතුව රු. 42 000කි. ඒ අනුව බැර පැත්තේ එකතුවට වඩා හර පැත්තේ එකතුව රු. 14 000ක් අඩු වීමෙන් බැංකු ගිණුමේ රු. 14 000ක බැර ශේෂයක් ලැබී ඇත. එම අගය බැංකු අයිරාව වේ. බැංකු අයිරාව ආපසු බැංකුවට ගෙවීමට බැඳී සිටින බැවින් ව්‍යාපාරයේ වගකීමක් වේ.



## ක්‍රියාකාරකම 02

විරාන් රෙදිපිළි අලෙවි කිරීමේ ව්‍යාපාරයක යෙදී සිටියි. ඔහු ගනුදෙනු කිරීම සඳහා බැංකු ජංගම ගිණුමක් විවෘත කර ඇති අතර දිගුකලක් විධිමත් ව ගනුදෙනු කර ඇති බැවින් ඕනෑ ම අවස්ථාවක රු. 100 000 දක්වා බැංකු අයිරාවක් ලබා ගැනීමේ අවස්ථාව ඔහු සතු ය.

20XX.05.01 දිනට ඔහුගේ ව්‍යාපාරයේ බැංකු ගිණුමේ තිබූ ශේෂය රු. 45 000ක් විය. මැයි මාසය තුළ දී ඔහුගේ බැංකු ජංගම ගිණුම සමග කළ ගනුදෙනු පහත දැක්වේ.

තැන්පත් කිරීම්

20XX.05.02 මුදල් රු. 14 000
05.11 චෙක්පත් තැන්පතු රු. 15 000
05.21 චෙක්පත් තැන්පතු රු. 16 000

චෙක්පත් නිකුත් කිරීම්

05.05 ණය හිමියකු වූ ප්‍රනාන්දුට රු. 12 000
05.13 වේතන ගෙවීම් රු. 20 000
05.18 කඩ කුලී රු. 10 000
05.22 ගැනුම් සඳහා රු. 34 000

තැන්පත් කරන ලද සියලු ම චෙක්පත් බැංකුවේ ජංගම ගිණුමට එකතු කොට තිබූ අතර නිකුත් කරන ලද චෙක්පත්වල අගය අඩු කොට තිබුණි.

අවශ්‍ය වන්නේ

01. ඉහත සඳහන් ගනුදෙනු බැංකු ගිණුමේ සටහන් කොට එය තුලනය කිරීම

02. 20XX.05.25 දින උපකරණ මිලදී ගැනීම සඳහා රු. 45 000ක චෙක් පතක් නිකුත් කළේ නම් ඔහු ලබා ගත් බැංකු අයිරාව දක්වීම

## 9.2 බැංකු සැසඳුම් විස්තරය

බැංකුවක ජංගම ගිණුමක් පවත්වාගෙන යන ව්‍යාපාරයක් විසින් එම ජංගම ගිණුම මගින් සිදුකරන ගනුදෙනු ව්‍යාපාරයේ පොත්වල බැංකු ගිණුමේ සටහන් කරන ආකාරය ඔබ මීට පෙර අධ්‍යයනය කර ඇත. ව්‍යාපාරයක් නමින් බැංකුවේ පවතින මුදල් ප්‍රමාණය ව්‍යාපාරයේ වත්කමකි. එම නිසා ව්‍යාපාරයේ පොත්වල පවත්වාගෙන යන බැංකු ගිණුම වත්කම් ගිණුමකි. වත්කම් ගිණුමට අදාළ ද්විත්ව සටහන් රීතීන්ට අනුකූල ව බැංකු ගිණුමේ ගනුදෙනු සටහන් කරනු ලැබේ. එහි දී බැංකු ශේෂය වැඩි වීමට බලපාන ගනුදෙනු බැංකු ගිණුමට හර කෙරෙන අතර බැංකු ශේෂය අඩු වීමට බලපාන ගනුදෙනු බැංකු ගිණුමට බැර කරනු ලැබේ.

වාණිජ බැංකු විසින් ව්‍යාපාරය නමින් පවතින බැංකු ජංගම ගිණුමෙහි ගනුදෙනු සටහන් කරන ආකාරය විමසා බලමු.

ව්‍යාපාරයක් විසින් බැංකු ජංගම ගිණුම මගින් සිදුකරන ගනුදෙනු බැංකුව ද බැංකුවේ පොත්වල ව්‍යාපාරය නමින් වූ ගිණුමක සටහන් කරයි. ව්‍යාපාරයක් වෙනුවෙන් බැංකුවේ පවතින ගිණුම එහි වගකීම් ගිණුමකි. එම නිසා බැංකුව ව්‍යාපාරයට අදාළ බැංකු ගිණුමේ ගනුදෙනු සටහන් කරන්නේ වගකීම් ගිණුමක ගනුදෙනු සටහන් කිරීමට අදාළ රීතිවලට අනුව ය. ඒ අනුව බැංකු ශේෂය වැඩි වීමට බලපාන ගනුදෙනු බැංකුව ව්‍යාපාරය නමින් පවත්වා ගන්නා ගිණුමට බැර කරන අතර ශේෂය අඩු වීමට බලපාන ගනුදෙනු ඊට හර කරයි.

ඉහත දක්වන ලද පරිදි ව්‍යාපාරයක බැංකු ගනුදෙනු කිහිපයක් බැංකුව විසින් තම පොත්වල සටහන් කර ඇති ආකාරය අධ්‍යයනය කරමු.

ජංගම ගිණුම

| දිනය | විස්තරය | හර | බැර | ශේෂය |
|---|---|---|---|---|
| | ආරම්භක ශේෂය (බැර) | | | XXX |
| | මුදල් තැන්පතු | | XXX | XXX |
| | චෙක් තැන්පතු | | XXX | X XXX |
| | චෙක්පත්වලට ගෙවීම් | XXX | | XXX |
| | සෘජු ලැබීම් | | XXX | XXX |
| | බැංකු ගාස්තු | XXX | | XXX |
| | චෙක්පොත් ගාස්තු | XXX | | XXX |

ව්‍යාපාරය විසින් බැංකු ගිණුමට හර කරන අගයන් බැංකුව විසින් ව්‍යාපාරයේ ගිණුමට බැර කෙරෙන අතර ව්‍යාපාරය විසින් බැංකු ගිණුමට බැර කෙරෙන අගයන් බැංකුව විසින් ව්‍යාපාරයේ ගිණුමට හර කරනු ලබයි. අවසානයේ දී ව්‍යාපාරයේ පොත්වල බැංකු ගිණුමේ හර ශේෂයක් පවතින විට බැංකුවේ පොත්වල ව්‍යාපාරය නමින් වූ ගිණුමේ බැර ශේෂයක් පෙන්නුම් කරයි.



නොමිලේ බෙදා හැරීම සඳහා ය.

## බැංකු ප්‍රකාශය (Bank Statement)

බැංකු ජංගම ගිණුමක් හිමි අයකුට බැංකුව විසින් සාමාන්‍යයෙන් මාසයකට වරක් වාර්තාවක් එවනු ලැබේ. අදාළ මාසය තුළ බැංකුව විසින් ගිණුමට කළ හර කිරීම්, බැර කිරීම් සහ ශේෂය මෙහි දැක්වේ. වර්තමානයේ දී නම් සාමාන්‍යයෙන් සිදුකෙරෙන්නේ සලකා බලන මාසයට අදාළ ව බැංකුවේ පවතින ගිණුමේ පරිගණක මුද්‍රිත පිටපතක් ව්‍යාපාරයට එවීම යි. මෙසේ බැංකුව එවනු ලබන වාර්තාව හෙවත් ගිණුමේ මුද්‍රිත පිටපත, බැංකු ප්‍රකාශය හෙවත් බැංකු ගිණුම් විස්තරය ලෙස හැඳින්වේ.

පහත දැක්වෙන්නේ බැංකු ප්‍රකාශයක පිටපතකි. එය නිරීක්ෂණය කරන්න.

STATEMENT OF ACCOUNT [redacted]
NAOTUNNA STORES KEKANADURA 81020

Branch Name / Code [redacted] CITY BRANCH
Account Number [redacted]

Date 30/08/2013
Currency LKR

| Date | Particulars | Payments | Receipts | Balance |
|---|---|---|---|---|
| 31/07 | BALANCE B/F | | | 34,654.10DR |
| 01/08 | CASH DEPOSIT | .00 | 13,000.00 | 21,654.10DR |
| 01/08 | ACH CLR 0174024 | 39,000.00 | .00 | 60,654.10DR |
| 02/08 | CASH DEPOSIT | .00 | 10,000.00 | 50,654.10DR |
| 05/08 | CASH DEPOSIT | .00 | 7,000.00 | 43,654.10DR |
| 06/08 | ACH CLR 0174023 | 20,800.00 | .00 | 64,454.10DR |
| 06/08 | CASH DEPOSIT | .00 | 9,000.00 | 55,454.10DR |
| 07/08 | CASH DEPOSIT | .00 | 5,000.00 | 50,454.10DR |
| 08/08 | CASH DEPOSIT | .00 | 5,000.00 | 45,454.10DR |
| 12/08 | CASH DEPOSIT | .00 | 5,000.00 | 40,454.10DR |
| 13/08 | CASH DEPOSIT | .00 | 12,000.00 | 28,454.10DR |
| 14/08 | CASH DEPOSIT | .00 | 29,000.00 | 545.90 |
| 15/08 | CHQ BOOK CHARGES | 375.00 | .00 | 170.90 |
| 22/08 | CASH DEPOSIT | .00 | 12,000.00 | 12,170.90 |
| 23/08 | ACH CLR 0182330 | 25,000.00 | .00 | 12,829.10DR |
| 23/08 | CASH DEPOSIT | .00 | 13,000.00 | 170.90 |
| 26/08 | CASH DEPOSIT | .00 | 10,000.00 | 10,170.90 |
| 27/08 | ACH CLR 0182327 | 4,000.00 | .00 | 6,170.90 |
| 27/08 | CASH DEPOSIT | .00 | 10,000.00 | 16,170.90 |
| 27/08 | ACH CLR 0182329 | 9,595.00 | .00 | 6,575.90 |
| 29/08 | ACH CLR 0182334 | 5,400.00 | .00 | 1,175.90 |
| 30/08 | CASH DEPOSIT | .00 | 10,000.00 | 11,175.90 |
| 30/08 | OD CHG SYS-GENERATED | 425.79 | .00 | 10,750.11 |
| 30/08 | BALANCE C/F | | | 10,750.11 |
| | **TOTAL UNREALIZED CHEQUES** | | | **.00** |
| | **TOTAL DEPOSITS 14 items** | | **150,000.00** | |
| | **TOTAL WITHDRAWALS 7 items** | **104,595.79** | | |

END OF STATEMENT

For clarifications if any, please contact the Branch Manager on 041 2222218

All the transactions shown on the statement should be verified and the Bank notified of any discrepancy immediately.
Any query relating to transactions beyond 03 months may be subject to levy of a fee.
Unrealised cheque deposits, if any are included in the Closing balance.

රූපය 9.4 බැංකු ප්‍රකාශයක පිටපතක්

ව්‍යාපාරය විසින් පිළියෙල කරන බැංකු ගිණුම තුලනය කළ විට ව්‍යාපාරයේ පොත්වලට අනුව බැංකුවේ පවතින මුදල් ප්‍රමාණය ලැබේ. බැංකුව විසින් එවනු ලබන බැංකු ප්‍රකාශයෙහි බැංකුවේ පොත්වලට අනුව ව්‍යාපාරයට අයත් ගිණුමේ පවතින ශේෂය දැක්වේ. ජංගම ගිණුමට අදාළ සියලු ම ගනුදෙනු දෙපාර්ශ්වය ම සටහන් කළේ නම් මෙම අගයන් දෙක එකිනෙකට සමාන විය යුතු ය. එහෙත් ප්‍රායෝගික ව ව්‍යාපාරයේ පොත්වල බැංකු ගිණුමේ දැක්වෙන ශේෂය සහ බැංකු ප්‍රකාශයේ දැක්වෙන ශේෂය එකිනෙකට වෙනස් වේ. එසේ වෙනස් වන්නේ සලකා බැලෙන කාලච්ඡේදය තුළ ව්‍යාපාරයේ පොත්වල බැංකු ගිණුමේ සටහන් කර ඇති සමහර අගයන් බැංකු ප්‍රකාශයේ සටහන් වී නොතිබීමත් බැංකු ප්‍රකාශයේ සටහන් ව ඇති සමහර අගයන් ව්‍යාපාරයේ පොත්වල බැංකු ගිණුමේ සටහන් වී නොතිබීමත් නිසා ය.

## බැංකු ගිණුමේ අවසාන ශේෂය සහ බැංකු ප්‍රකාශයේ අවසාන ශේෂය එකිනෙකට වෙනස් වීම සඳහා බලපාන හේතු

### 01. නිකුත් කළ නමුත් ගෙවීම් සඳහා බැංකුවට ඉදිරිපත් නොකළ චෙක්පත්

ව්‍යාපාරය නිකුත් කරන චෙක්පත් ව්‍යාපාරයේ පොත්වල බැංකු ගිණුමට බැර කෙරෙයි. එවිට ව්‍යාපාරයේ පොත්වල ඇති බැංකු ගිණුමේ ශේෂය අඩු වේ. මෙසේ නිකුත් කරන චෙක්පත්වලින් සමහර චෙක්පත් කාලච්ඡේදය අවසානය වන විටත් ඒවායෙහි හිමිකරුවන් බැංකුව වෙත ඉදිරිපත් කර මුදල් ලබාගෙන නොතිබීමට ඉඩ ඇත. නිකුත් කළ නමුත් බැංකුවට ඉදිරිපත් නොවූ චෙක් පත් ලෙස හඳුන්වන්නේ මේවා ය. එම චෙක්පත්වලට බැංකුව මුදල් ගෙවා නැති නිසා බැංකු ප්‍රකාශයේ ගෙවීම් ලෙස වාර්තා වී නැත.



**එබැවින් ව්‍යාපාරයේ බැංකු ගිණුමේ දැක්වෙන ශේෂය, බැංකු ප්‍රකාශයේ දැක්වෙන ශේෂයට වඩා අඩු වේ.**

### 02. තැන්පත් කළ නමුත් නිෂ්කාශනය නොවූ චෙක්පත්

ව්‍යාපාරයට ලැබී ඇති චෙක්පත් බැංකුවේ තැන්පත් කළ විට ව්‍යාපාරය එය බැංකු ගිණුමට හර කරයි. එවිට ව්‍යාපාරයේ පොත්වල ඇති බැංකු ගිණුමේ ශේෂය වැඩි වේ. මෙසේ තැන්පත් කළ චෙක්පත්වලින් සමහර චෙක්පත් එම කාලච්ඡේදය තුළ නිෂ්කාශනය නොවීම හෙවත් උපලබ්ධි නොවීම සිදුවිය හැකි ය. චෙක්පත් නිෂ්කාශනය වීම යනු චෙක්පතේ සඳහන් වටිනාකම බැංකුවේ පවතින ජංගම ගිණුමේ වටිනාකමට එකතු වීම වේ. චෙක්පතක් බැංකුවේ තැන්පත් කළ විට එහි වටිනාකම ගිණුමට එකතු වීම සඳහා දින කිහිපයක් ගත විය හැකි ය. එබැවින් නියමිත කාලච්ඡේදය අවසාන වන විට ව්‍යාපාරයක් විසින් තැන්පත් කළ සමහර චෙක්පත්වල වටිනාකම බැංකුව ව්‍යාපාරයට අයත් ගිණුමේ සටහන් කර නොතිබීමට ඉඩ ඇත. තැන්පත් කළ නමුත් නිෂ්කාශනය නොවූ චෙක්පත් ලෙස හඳුන්වන්නේ මේවා ය. මේ නිසා තැන්පත් කරනු ලැබූව ද නිෂ්කාශනය නොවූ චෙක්පත් බැංකු ප්‍රකාශයේ තැන්පතු ලෙස වාර්තා වී නැත.



**එබැවින් ව්‍යාපාරයක බැංකු ගිණුමේ දැක්වෙන ශේෂය, බැංකු ප්‍රකාශයේ දැක්වෙන ශේෂයට වඩා වැඩි වේ.**

### 03. ඍජු ප්‍රේෂණ

සමහර ගනුදෙනුකරුවන් ව්‍යාපාරයට ලබා දිය යුතු වටිනාකම් ඍජුව ම ව්‍යාපාරයේ ජංගම ගිණුමේ තැන්පත් කරන අවස්ථා ඇත. එසේ ම ව්‍යාපාරයට ලැබිය යුතු කුලී, පොලී සහ ලාභාංශ යනාදිය ද ඍජු ව බැංකු ජංගම ගිණුමට එවන අවස්ථා ඇත. ඒවා ඍජු ප්‍රේෂණ ලෙස හැඳින්වේ. ඍජු ප්‍රේෂණ ලැබීම් පිළිබඳ ව ව්‍යාපාරයට දැනගත හැකිවන්නේ බැංකු ප්‍රකාශය ලැබීමෙන් පසුව ය. එලෙස ලැබී ඇති ඍජු ප්‍රේෂණ බැංකු ප්‍රකාශයේ ලැබීම් (බැර) ලෙසට වාර්තා වුව ද ව්‍යාපාරයේ බැංකු ගිණුමේ වාර්තා වී නැත.



**එබැවින් ව්‍යාපාරයේ බැංකු ගිණුමේ දැක්වෙන ශේෂය, බැංකු ප්‍රකාශයේ දැක්වෙන ශේෂයට වඩා අඩුවේ.**

### 04. ස්ථාවර නියෝග මත ගෙවීම්

ව්‍යාපාරය විසින් ගෙවිය යුතු බැංකු ණය වාරික, කල් බදු ණය වාරික, රක්ෂණ ගාස්තු වැනි සමහර ගෙවීම් බැංකුවේ පවතින මුදල්වලින් ගෙවන ලෙසට ගිණුම් හිමියන් විසින් ලිඛිත ව බැංකුවට දැනුම්දීම ස්ථාවර නියෝග ලෙස හැඳින්වෙයි. එවැනි දැනුම් දීම් මත බැංකුව විසින් කරන ගෙවීම් සිදුකර ඇති බව ව්‍යාපාරයට දැනගත හැකිවන්නේ ද බැංකු ප්‍රකාශය ලැබුණු පසුව ය. බැංකුව විසින් ස්ථාවර නියෝග මත ගෙවීම සිදුකර එම වටිනාකම බැංකු ජංගම ගිණුමෙන් අඩු (හර) කරයි. එවිට බැංකු ප්‍රකාශයේ දී ස්ථාවර නියෝග මත ගෙවීම් අඩු වී ඇතත් ව්‍යාපාරයේ බැංකු ගිණුමේ එම වටිනාකම බැර පැත්තේ සටහන් වී නැත.



**එබැවින් ව්‍යාපාරයේ බැංකු ගිණුමේ දැක්වෙන ශේෂය බැංකු ප්‍රකාශයේ දැක්වෙන ශේෂයට වඩා වැඩි අගයක් ගනී.**

### 05. බැංකු ගාස්තු සහ චෙක්පොත් ගාස්තු

ජංගම ගිණුම් හිමියෙකුට බැංකුව මගින් සපයන සේවා වෙනුවෙන් බැංකුව ජංගම ගිණුමෙන් අයකරන ගාස්තු බැංකු ගාස්තු වේ. බැංකුව ලබා දෙන චෙක් පොත් වෙනුවෙන් අය කරන ගාස්තු චෙක්පොත් ගාස්තු වේ. මෙවැනි ගාස්තු ව්‍යාපාරයට දැනගත හැකි වන්නේ බැංකු ප්‍රකාශය ලැබීමෙන් පසුව ය. එසේ අයකළ ගාස්තු බැංකු ප්‍රකාශයේ ගෙවීම් ලෙසට (හර තීරුවේ) සටහන් වී ඇත. එහෙත් ව්‍යාපාරයේ බැංකු ගිණුමේ අදාළ කාලච්ඡේදය අවසාන වන විටත් ඒවා වාර්තා වී නැත.



**එබැවින් ව්‍යාපාරයේ බැංකු ගිණුමේ දැක්වෙන ශේෂය බැංකු ප්‍රකාශයේ දැක්වෙන ශේෂයට වඩා වැඩි ය.**

ඉහත සඳහන් කළ ආකාරයට ව්‍යාපාරයේ පොත්වල බැංකු ගිණුමේ අවසාන ශේෂය සහ බැංකු ප්‍රකාශයේ දැක්වෙන ශේෂය අතර වෙනසක් පැවතිය හැකි ය.

ඉහත දැක්වූ වෙනස්කම් හඳුනාගත හැක්කේ ව්‍යාපාරයේ බැංකු ගිණුම හා බැංකුවෙන් එවනු ලැබූ බැංකු ප්‍රකාශය සැසඳීමෙනි. ඒ අනුව පළමුවෙන් සිදු කළ යුත්තේ බැංකු ගිණුම සහ බැංකු ප්‍රකාශය සසඳා වෙනසට බලපාන හේතු හඳුනා ගැනීම ය.



නොමිලේ බෙදා හැරීම සඳහා ය.

ඒ සඳහා

[ බැංකු ගිණුමේ හර පැත්ත, බැංකු ප්‍රකාශයේ බැර තීරුව සමගත්
[ බැංකු ගිණුමේ බැර පැත්ත, බැංකු ප්‍රකාශයේ හර තීරුව සමගත් සැසඳිය යුතු ය.

එහි දී බැංකු ගිණුමේ ඇති අගය එකින් එක ගෙන ඒවා බැංකු ප්‍රකාශයේ ඇතුළත් ව තිබේ ද යන්න පරීක්ෂා කළ යුතු ය. මේ සඳහා බැංකු ගිණුම හා බැංකු ප්‍රකාශය යන දෙකෙහි ම සටහන් වී ඇති අගය ලකුණු කරගත යුතු ය. එවිට ලකුණු නොවී ඉතිරි වන්නේ එක් ප්‍රකාශයක පමණක් ඇතුළත් ව ඇති අගය වේ. අවසාන ශේෂයන්ගේ වෙනසට බලපා ඇත්තේ එම අගය ය.

පහත දැක්වෙන අභ්‍යාසය විසඳීම තුළින් මේ පිළිබඳ ව අවබෝධය ලබාගැනීම පහසු වේ.

**නිදසුන :-**

නදීකාගේ ව්‍යාපාරයේ 20XX ජූලි මාසය සඳහා බැංකු ගිණුම හා බැංකු ප්‍රකාශය පහත දැක්වේ.

හර　　　　　　　　බැංකු ගිණුම　　　　　　　　බැර

| දිනය | විස්තරය | ස. පි | වටිනාකම රු. | දිනය | විස්තරය | ස. පි | වටිනාකම රු. |
|---|---|---|---|---|---|---|---|
| 20XX.07.01 | ශේෂය ඉ/ගෙ | | 15 000 | 20XX.07.06 | ණයහිමියෝ (112) | | 10 000 |
| 07.05 | මුදල් තැන්පතු | | 8 000 | 07.18 | ණයහිමියෝ (113) | | 4 000 |
| 07.12 | චෙක් තැන්පතු (65) | | 12 000 | 07.23 | ණයහිමියෝ (114) | | 16 000 |
| 07.13 | චෙක් තැන්පතු (46) | | 5 000 | 07.31 | ශේෂය ප/ගෙ | | 31 000 |
| 07.20 | මුදල් තැන්පතු | | 7 000 | | | | |
| 07.28 | චෙක් තැන්පතු (58) | | 14 000 | | | | |
| | | | 61 000 | | | | 61 000 |
| 08.01 | ශේෂය ඉ/ගෙ | | 31 000 | | | | |

20XX ජූලි මාසය සඳහා බැංකු ප්‍රකාශය

| දිනය | විස්තරය | හර | බැර | ශේෂය |
|---|---|---|---|---|
| 20XX.07.01 | ශේෂය ඉ/ගෙ | | | 15 000 |
| 07.05 | මුදල් | | 8 000 | 23 000 |
| 07.07 | චෙක් 112 | 10 000 | | 13 000 |
| 07.15 | චෙක් 65 | | 12 000 | 25 000 |
| 07.16 | චෙක් 46 | | 5 000 | 30 000 |
| 07.18 | ණයගැති ප්‍රේෂණ | | 11 000 | 41 000 |
| 07.20 | මුදල් තැන්පතු | | 7 000 | 48 000 |
| 07.22 | චෙක් 113 | 4 000 | | 44 000 |
| 07.25 | ස්ථාවර නියෝග (බැංකු ණය වාරිකය) | 18 000 | | 26 000 |
| 07.31 | බැංකු ගාස්තු | 3 000 | | 23 000 |


නොමිලේ බෙදා හැරීම සඳහා ය.

ඉහත නිදසුනේ දැක්වෙන පරිදි

20XX.07.31 දිනට ව්‍යාපාරයේ බැංකු ගිණුමේ වාසිදායක ශේෂය රු. 31 000කි.
20XX.07.31 දිනට බැංකු ප්‍රකාශයේ දැක්වෙන ශේෂය රු. 23 000කි.

ශේෂ දෙකේ වටිනාකම් එකිනෙකට වෙනස් වූ බැවින් වෙනසට හේතු සොයාගත යුතු වේ. එය පහත පරිදි වේ.

හර බැංකු ගිණුම බැර

| දිනය | විස්තරය | ස. පි | වටිනාකම රු. | දිනය | විස්තරය | ස. පි | වටිනාකම රු. |
|---|---|---|---|---|---|---|---|
| 20XX.07.01 | ශේෂය ඉ/ගෙ | | 15 000 ✓ | 20XX.07.06 | ණයහිමියෝ (112) | | 10 000 ✓ |
| 07.05 | මුදල් තැන්පතු | | 8 000 ✓ | 07.18 | ණයහිමියෝ (113) | | 4 000 ✓ |
| 07.12 | චෙක් තැන්පතු (65) | | 12 000 ✓ | 07.23 | ණයහිමියෝ (114) | | 16 000 |
| 07.13 | චෙක් තැන්පතු (46) | | 5 000 ✓ | 07.31 | ශේෂය ප/ගෙ | | 31 000 |
| 07.20 | මුදල් තැන්පතු | | 7 000 ✓ | | | | |
| 07.28 | චෙක් තැන්පතු (58) | | 14 000 | | | | |
| | | | 61 000 | | | | 61 000 |
| 08.01 | ශේෂය ඉ/ගෙ | | 31 000 | | | | |

20XX ජූලි මාසය සඳහා බැංකු ප්‍රකාශය

| දිනය | විස්තරය | හර | බැර | ශේෂය |
|---|---|---|---|---|
| 20XX.07.01 | ශේෂය ඉ/ගෙ | | | 15 000 |
| 07.05 | මුදල් | | 8 000 ✓ | 23 000 |
| 07.07 | චෙක් 112 | 10 000 ✓ | | 13 000 |
| 07.15 | චෙක් 65 | | 12 000 ✓ | 25 000 |
| 07.16 | චෙක් 46 | | 5 000 ✓ | 30 000 |
| 07.18 | ණයගැති ප්‍රේෂණ | | 11 000 | 41 000 |
| 07.20 | මුදල් තැන්පතු | | 7 000 ✓ | 48 000 |
| 07.22 | චෙක් 113 | 4 000 ✓ | | 44 000 |
| 07.25 | ස්ථාවර නියෝග (බැංකු ණය වාරිකය) | 18 000 | | 26 000 |
| 07.31 | බැංකු ගාස්තු | 3 000 | | 23 000 |

**ශේෂයන් අතර වෙනසට හේතු**

**01. බැංකු ගිණුමේ හර පැත්ත හා බැංකු ප්‍රකාශයේ බැර තීරුව සමග සැසඳීම කළ විට**

[ තැන්පත් කළ නමුත් නිෂ්කාශනය නොවූ චෙක්පත (58) රු. 14 000

[ බැංකුවට සෘජු ව ම ලැබී ඇති ණයගැති ප්‍රේෂණ රු. 11 000

02. **බැංකු ගිණුමේ බැර පැත්ත සහ බැංකු ප්‍රකාශයේ හර තීරුව සමග සැසඳීම කළ විට**

[ බැංකුව වෙත ඉදිරිපත් නොකළ චෙක්පත් (114) රු. 16 000

[ බැංකු ගිණුමේ සටහන් නොවූ ස්ථාවර නියෝග මත කළ ගෙවීම් (බැංකු ණය වාරිකය) රු. 18 000

[ බැංකු ගිණුමේ සටහන් නොවූ බැංකුව අයකළ ගාස්තු රු. 3 000

මෙම වෙනස්කම් ගැළපීම හා සැසඳීම සඳහා පියවර දෙකක් අනුගමනය කළ යුතු වේ.

01. ව්‍යාපාරයේ බැංකු ගිණුමේ ශේෂය සංශෝධනය කිරීම

02. සංශෝධිත බැංකු ශේෂය යොදා ගනිමින් බැංකු සැසඳුම් ප්‍රකාශය පිළියෙල කිරීම

## ව්‍යාපාරයේ දැක්වෙන බැංකු ගිණුමේ ශේෂය සංශෝධනය කිරීම

ව්‍යාපාරයෙහි බැංකු ගිණුමේ ශේෂය සහ බැංකු සැසඳුම් ප්‍රකාශයේ ශේෂය අතර වෙනස සඳහා බලපාන හේතු අතරින් සමහර හේතු බැංකු ගිණුමෙහි දැක්වෙන වැරදි හෝ අතහැරීම් වැනි අඩු පාඩු විය හැකි ය. මෙම අඩු පාඩු නිසා බැංකු ගිණුමෙහි දැක්වෙන ශේෂය වැරදි සහගත වේ. එබැවින් එය නිවැරදි කළ යුතු ය. එසේ නිවැරදි කිරීම බැංකු ගිණුම සංශෝධනය කිරීම ලෙස හැඳින්වේ.

ඉහත දැක්වූ නිදසුනට අනුව පහත සඳහන් හේතුවලට අදළ අගය බැංකු ගිණුමෙහි ගැළපිය යුතු ය.

01. සෘජු ප්‍රේෂණ ලැබීම් (ණයගැති ප්‍රේෂණ)
02. ස්ථාවර නියෝග මත ගෙවීම් (බැංකු ණය වාරිකය)
03. බැංකුව ගිණුමෙන් අයකරගෙන ඇති ගාස්තු



සෘජු ප්‍රේෂණ ලැබීම් මගින් බැංකු ගිණුමේ ශේෂය වැඩි විය යුතු ය. මේ නිසා සෘජු ප්‍රේෂණ බැංකු ගිණුමට හර කළ යුතු ය.

ස්ථාවර නියෝග මත සිදුකළ ගෙවීම් සහ බැංකුව විසින් ගිණුමෙන් අයකළ ගාස්තු නිසා බැංකු ශේෂය අඩු විය යුතු ය. එම නිසා බැංකු ගිණුමට ස්ථාවර නියෝග මත සිදුකළ ගෙවීම්, බැංකුව අයකළ ගාස්තු යනාදිය බැර කළ යුතු ය.

ඉහත ආකාරයට ගැළපීම් සිදුකළ පසු **බැංකු ගිණුමේ සංශෝධිත ශේෂය** ලැබේ.



නොමිලේ බෙදා හැරීම සඳහා ය.

දී ඇති නිදසුනට අනුව  බැංකු ගිණුම සංශෝධනය කරන ආකාරය පහත දැක්වේ.

හර                                   බැංකු ගිණුම (සංශෝධිත)                                   බැර

| දිනය | විස්තරය | ස. පි | වටිනාකම රු | දිනය | විස්තරය | ස. පි | වටිනාකම රු |
|---|---|---|---|---|---|---|---|
| 20XX.07.01 | ශේෂය ඉ/ගෙ | | 31 000 | 20XX.07.25 | බැංකු ණය | | 18 000 |
| 07.18 | ණයගැති ප්‍රේෂණ | | 11 000 | 0731 | බැංකු ගාස්තු | | 3 000 |
| | | | | | ශේෂය ප/ගෙ | | 21 000 |
| | | | 42 000 | | | | 42 000 |
| | ශේෂය ඉ/ගෙ | | 21 000 | | | | |

**සංශෝධිත බැංකු ශේෂය යොදා ගනිමින් බැංකු සැසඳුම් ප්‍රකාශය පිළියෙල කිරීම**

සංශෝධිත බැංකු ගිණුමේ ශේෂය පිළියෙල කිරීමෙන් පසු එම ශේෂය තව දුරටත් බැංකු ප්‍රකාශයේ ශේෂය සමග නොගැළපෙන්නේ නම් බැංකු ශේෂයන්ගේ වෙනසට පහත සඳහන් හේතු ප්‍රධාන වශයෙන් අදාළ වේ.

- තැන්පත් කළ නමුත් නිෂ්කාශනය නොවූ චෙක්පත්වල වටිනාකම
- නිකුත් කළ නමුත් බැංකුවට ඉදිරිපත් නොවූ චෙක්පත්වල වටිනාකම

එබැවින් මෙම හේතු දෙක බැංකු ගිණුමෙහි නොගළපන්නේ එය බැංකු ගිණුමේ ගනුදෙනු වාර්තා කිරීමට අදාළ වැරදි හෝ අත්හැරීම් නොවන බැවිනි.

මෙම ඉතිරිවන හේතු ඇතුළත් කර බැංකු ගිණුමේ සංශෝධිත ශේෂය බැංකු ප්‍රකාශයේ ශේෂය සමග සැසඳීමට ප්‍රකාශයක් පිළියෙල කළ යුතුය. **බැංකු සැසඳුම් ප්‍රකාශය** ලෙස හඳුන්වන්නේ එයයි. බැංකු සැසඳුම් ප්‍රකාශය පිළියෙල කිරීම මගින් ශේෂවල නිවැරදිතාව තහවුරු කර ගත හැකි ය.

ඒ අනුව



නිකුත් කළ නමුත් එම කාලසීමාව තුළ බැංකුවට ඉදිරිපත් නොකළ චෙක්පත් පැවතීම නිසා බැංකු ප්‍රකාශයේ සඳහන් ශේෂයට වඩා බැංකු ගිණුමේ ශේෂය අඩු ය. එබැවින් බැංකුවට ඉදිරිපත් නොවූ චෙක්පත් බැංකු සැසඳුම් ප්‍රකාශයේ බැංකු ගිණුමේ සංශෝධිත ශේෂයට එකතු කිරීමක් වශයෙන් දැක්විය යුතු ය.

තැන්පත් කළ නමුත් අදාළ කාලසීමාව තුළ නිෂ්කාශනය නොවූ චෙක්පත් පැවතීම නිසා බැංකු ගිණුමේ ශේෂය බැංකු ප්‍රකාශයේ ශේෂයට වඩා වැඩි ය. එබැවින් සංශෝධිත බැංකු ශේෂයෙන් නිෂ්කාශනය නොවූ චෙක්පත්වල වටිනාකම අඩු කිරීමක් වශයෙන් දැක්විය යුතු ය.

ඉහත හේතු දෙක ඇතුළත් කර බැංකු සැසඳුම් විස්තරය පිළියෙල කළ විට ලැබෙන ශේෂය බැංකු ප්‍රකාශයේ සඳහන් ශේෂය වේ.

දී ඇති නිදසුනට අනුව සංශෝධිත බැංකු ශේෂය යොදා ගනිමින් බැංකු සැසඳුම් විස්තරය පිළියෙල කරන ආකාරය පහත දැක්වෙන පරිදි වේ.

නදීකාගේ ව්‍යාපාරය
20XX ජූලි මාසය සඳහා බැංකු සැසඳුම් විස්තරය

| | රු. | රු. |
|---|---|---|
| සංශෝධිත බැංකු ශේෂය | | 21 000 |
| එකතු කළා | | |
| බැංකුවට ඉදිරිපත් නොකළ චෙක්පත (114) | 16 000 | 16 000 |
| | | 37 000 |
| අඩු කළා | | |
| නිෂ්කාශනය නොවූ චෙක්පත (58) | 14 000 | 14 000 |
| 20XX.07.31 දිනට බැංකු ප්‍රකාශයේ සඳහන් ශේෂය | | 23 000 |

**මේ අනුව යම් ව්‍යාපාරයක යම් කාලච්ඡේදයකට අදාළ ව බැංකු ගිණුමේ ශේෂය බැංකු ප්‍රකාශයේ ශේෂය සමග නොගැළපෙන්නේ නම් එම ශේෂ සැසඳීම සඳහා අනුගමනය කළ යුතු පියවර පහත දැක්වෙන පරිදි සාරාංශ කළ හැකි වේ.**

- ව්‍යාපාරයේ බැංකු ගිණුමේ අවසාන ශේෂය සහ බැංකු ප්‍රකාශයේ සඳහන් අවසාන ශේෂය අතර වෙනසක් පවතී ද යන්න බැලීම
- ශේෂ අතර වෙනසක් පවතීනම් බැංකු ගිණුම සහ බැංකු ප්‍රකාශය සංසන්දනය කර එම වෙනසට හේතු අනාවරණ කර ගැනීම
- ව්‍යාපාරයේ බැංකු ගිණුමේ අවසාන ශේෂය සංශෝධනය කර ගැනීම
- සංශෝධිත බැංකු ශේෂය යොදාගනිමින් බැංකු සැසඳුම් විස්තරය පිළියෙල කිරීම



## ක්‍රියාකාරකම 03

සෙව්වන්දි පෙරේරාගේ ව්‍යාපාරයේ 20XX ජූලි මාසයේ බැංකු ගිණුමේ වාසිදායක ශේෂය රු. 45 000කි. බැංකු ප්‍රකාශයේ දක්නට ලැබුණේ වෙනත් ශේෂයකි. වෙනසට හේතු පහත දැක්වේ.

01. තැන්පත් කරන ලද පහත සඳහන් චෙක්පත් 20XX.07.31 දින වන විටත් නිෂ්කාශනය වී නැත.

චෙක් අංක 48 රු. 7 500
චෙක් අංක 94 රු. 8 600

02. නිකුත් කරන ලද පහත දැක්වෙන චෙක්පත් 20XX.07.31 දින වන විටත් බැංකුවට ඉදිරිපත් කර නැත.

චෙක් අංක 45 රු. 11 400
චෙක් අංක 49 රු. 8 600

03. බැංකු ප්‍රකාශයේ සඳහන්ව ඇති පහත සඳහන් දෑ ව්‍යාපාරයේ බැංකු ගිණුමේ සඳහන්ව නැත.

ස්ථාවර නියෝග මත බැංකුව විසින් ගෙවා ඇති රක්‍ෂණ වාරිකය රු. 8 000
බැංකුවට ඍජුව ම ලැබී ඇති ආයෝජන ආදායම රු. 4 200
බැංකුව විසින් අඩුකරගෙන ඇති බැංකු ගාස්තු රු. 2 500

අවශ්‍ය වන්නේ :-

01. බැංකු ගිණුම සංශෝධනය කිරීම

02. බැංකු ගිණුමේ සංශෝධිත ශේෂය යොදාගනිමින් බැංකු ප්‍රකාශයේ 20XX.07.31 දිනට බැංකු සැසඳුම් විස්තරය පිළියෙල කිරීම.



## ක්‍රියාකාරකම 04

පහත දැක්වෙන්නේ ජයරත්න සිල්වාගේ ව්‍යාපාරයේ 20XX.05.31 දිනට උපුටාගත් බැංකු ගිණුම හා බැංකුවෙන් ඔහුවෙත ලැබී ඇති බැංකු ප්‍රකාශය වේ.

බැංකු ගිණුම

| දිනය | විස්තරය | වටිනාකම රු | දිනය | විස්තරය | වටිනාකම රු |
|---|---|---|---|---|---|
| 20XX.05.01 | ශේෂය ඉ/ගෙ | 16 000 | 20XX.05.04 | වේතන (501) | 8 500 |
| 05.06 | මුදල් | 20 000 | 05.09 | ණයහිමි (502) | 17 500 |
| 05.12 | චෙක් තැන්පත් (142) | 14 000 | 05.18 | කඩකුලී (503) | 9 000 |
| 05.24 | චෙක් තැන්පත් (234) | 15 000 | 05.26 | ගැනුම් (505) | 12 000 |
| 05.29 | චෙක් තැන්පත් (184) | 18 000 | 05.27 | ණයහිමි (506) | 17 000 |
| | | | 05.31 | ශේෂය ප/ගෙ | 19 000 |
| 06.01 | ශේෂය ඉ/ගෙ | 83 000 | | | 83 000 |
| | | 19 000 | | | |



නොමිලේ බෙදා හැරීම සඳහා ය.

බැංකු ප්‍රකාශය

ජයරත්න සිල්වා
නොː 45
මහරගම

මහජන බැංකුව
මහරගම ශාඛාව

| දිනය | විස්තරය | හර රු. | බැර රු. | ශේෂය රු. |
|---|---|---|---|---|
| 20XX.05.01 | ඉදිරියට ගෙනා ශේෂය | | | 16 000 |
| 20XX.05.06 | මුදල් තැන්පතු | | 20 000 | 36 000 |
| 20XX.05.10 | චෙක්පත් ගෙවීම් 501 | 8 500 | | 27 500 |
| 20XX.05.12 | චෙක්පත් ගෙවීම් 502 | 17 500 | | 10 000 |
| 20XX.05.14 | චෙක් තැන්පතු 142 | | 14 000 | 24 000 |
| 20XX.05.15 | ස්ථාවර නියෝග (බැංකු ණය) | 19 000 | | 5 000 |
| 20XX.05.26 | චෙක් තැන්පත් 234 | | 15 000 | 20 000 |
| 20XX.05.27 | ණයගැතිප්‍රේෂණ | | 8 000 | 28 000 |
| 20XX.05.28 | චෙක්පත් ගෙවීම් 505 | 12 000 | | 16 000 |
| 20XX.05.30 | බැංකු ගාස්තු | 2 000 | | 14 000 |

අවශ්‍ය වන්නේ :-

01. 20XX.05.31 දිනට ශේෂයන්ගේ අසමානතාවට හේතු වූ කරුණු දැක්වීම

02. 20XX.05.31 දිනට බැංකු ගිණුමේ ශේෂය සංශෝධනය කිරීම

03. සංශෝධිත බැංකු ගිණුමේ ශේෂය යොදා ගනිමින් බැංකු සැසඳුම් ප්‍රකාශය පිළියෙල කිරීම



## ක්‍රියාකාරකම 05

බැංකු ජංගම ගිණුමක් පවත්වා ගනිමින් සිදුකළ ගනුදෙනු ඇතුළත් කර බැංකුව විසින් 20XX මාර්තු මාසය සඳහා ඔබ වෙත බැංකු ප්‍රකාශයක් එවා ඇතැයි සිතන්න. බැංකු ප්‍රකාශයේ දැක්වෙන අවසාන ශේෂය ඔබ පිළියෙල කළ බැංකු ගිණුමේ ශේෂයට වඩා වෙනස් වී ඇති බව අනාවරණය විය.

01. බැංකු ගිණුමේ ශේෂය හා බැංකු ප්‍රකාශයේ දැක්වෙන ශේෂය වෙනස්වීමට හේතු විය හැකි කරුණු සඳහන් කරන්න.

02. බැංකු ප්‍රකාශයේ ශේෂය, බැංකු ගිණුමේ ශේෂයට වඩා වැඩි වූයේ නම් එසේ වීමට හේතු විය හැකි කරුණු ඔබ සඳහන් කළ හේතු අතරින් තෝරා ලියන්න.



නොමිලේ බෙදා හැරීම සඳහා ය.